


# අපේ ආර්ථික ප්‍රශ්න

**මෙහෙම වෙලා තියෙන්නේ අපේ රටේ මිනිස්සු කම්මැලි නිසා නොවෙයි. සමාජයේ ඉන්න මිනිස්සු විවිධාකාරයි. නවීන කළමණාකරන නියමයන්ට අනුව නම්, මිනිස්සු කම්මැලි වෙන්නේ හෝ හොඳින් වැඩ කරන්නෙත්, වගකිම් ගන්නේ හෝ වගකිම් සොයා යන්නෙත් ඔවුන් මුහුණ දි තිබෙන හෝ මුහුණ දෙමින් සිටින විවිධ සමාජ ආර්ථික වාතාවරණයන්ට අනුවයි. ඇතැම් වාතාවරණයන් තුල මිනිස්සු සාමුහිකව තීරණ ගන්නත්, පුද්ගලිකව වගකීම් භාර ගන්නත් ලැස්තියි.**

එක එක රටවල පවතින ආර්ථික ප්‍රශ්න අතරේ සමාන බවකුත් වෙනස් බවකුත් දකින්න පුළුවන්. දියුණු ආර්ථිකයන් තිබෙන රටවල ප්‍රශ්න දියුණු වෙන රටවල ප්‍රශ්න එක්ක සන්සන්දනය කරන්න ටිකක් අමාරුයි. දියුණු රටවල් වල තිබෙන ආර්ථික, තාක්ෂණික සහ බුද්ධිමය පදනම නිසාත්, ඒවයේ තිබෙන ප්‍රබල වාණිජ ආයතනයන් විසින් අනෙක් රටවල් තුල කර ඇති ප්‍රාග්ධන ආයෝජන නිසාත්, දියුණු රටවල් වලට වඩා කරන ජන කොටස් වලට යම් ආකාරයක සුබ සාධක සේවා තත්වයන් පවත්වා ගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා. මෙවැනි පදනමක් නැති අපි වගේ රටවල් වලට එහෙම කරගෙන යන්න තරම් හැකියාවක් හෝ තත්වයක් නැහැ.

මෙහෙම වෙලා තියෙන්නේ අපේ රටේ මිනිස්සු කම්මැලි නිසා නොවෙයි. සමාජයේ ඉන්න මිනිස්සු විවිධාකාරයි. නවීන කළමණාකරන නියමයන්ට අනුව නම්, මිනිස්සු කම්මැලි වෙන්නේ හෝ හොඳින් වැඩ කරන්නෙත්, වගකිම් ගන්නේ හෝ වගකිම් සොයා යන්නෙත් ඔවුන් මුහුණ දි තිබෙන හෝ මුහුණ දෙමින් සිටින විවිධ සමාජ ආර්ථික වාතාවරණයන්ට අනුවයි. ඇතැම් වාතාවරණයන් තුල මිනිස්සු සාමුහිකව තීරණ ගන්නත්, පුද්ගලිකව වගකීම් භාර ගන්නත් ලැස්තියි. එවැනි වාතාවරණයන් ගොඩ නැගෙන්නේ මිනිස්සුන්ට මිනිස්සු හැටියට සලකන, ගරු කරන, ඔවුන්ට යහපත් මග පෙන්වීමක් කල හැකි නායකත්වයක් ඇති විටක පමණයි.

1948 න් පස්සේ ගතවුණු අවුරුදු හතක කාලය තුල විවිධ ආකාරයේ ප්‍රශ්න වලට අපි මුහුණ දී තිබෙනවා. පුරාණයේ අපට තිබුණ ශ්‍රේෂ්ඨ අතීතයක් ගැන ආඩම්බර වෙනවා වාගේම, මෑත අතීතයේ අප ක්‍රියා කරපු ආකාරය ගැන ආපහු හැරී කල්පනා කරන්නේ නැතිව, අනාගතයේ අප ගත යුතු මාවත මොකක්ද යන්න සලකුනු කර ගන්න බැරි බවත් අපි තේරුම් ගත යුතුයි. වඩාත් වැදගත් වෙන්නේ, එසේ කිරීමෙන් අපේ රටේ අනාගතය පිළිබඳව අපට තිබෙන වගකීම ගැන කල්පනා කර බලා අපේ රටේ ජන කොටස් වලට වඩා යහපතක් වෙන ආකාරයට කටයුතු කිරීමට මග පාදා ගැනීමයි.

යටත් විජිතවාදයට විරුද්ධව කරපු අරගලයක් තුළින් හෝ ධනේෂ්වර සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසින් හෝ අපේ රටේ විසු විවිධ ජන කොටස් ලාංකීය සමාජය බලවේගයක් හැටියට ගොනු කර ගන්න අපේ රටේ දේශපාලන නායකත්වට බැරි වුනා, තවමත් බැරි වෙලා තිබෙනවා. එහෙම සාමුහිකත්වයක් නැති තැනක අපි වෙන වෙනම සිංහල, දමිල, මුස්ලිම් හැටියට පමණක් කල්පනා කරන්න එක ගැන පුදුම විය යුතු නැහැ. සමාජ විපර්යාසයන් තුළින් එවැනි සාමුහිකත්වයක් ගොඩ නගා ගනිපු සමාජයන් ධනවාදය තුළින් හෝ සමාජවාදය තුළින් ආර්ථික වශයෙන් දියුණුවක් ඇති කර ගෙන තිබෙනවා.

එක්දහස් නමසිය හතලිස් ගණන්වල අගභාගයේ අපේ ආර්ථිකයේ හොඳ තත්වයක් තිබුණ බව ඇත්තයි. ඒකට හේතු වුණේ කොරියන් යුද්ධය නිසා අපේ රබර් වලට හොඳ මිලක් ලැබීමයි. මේ නිසා ආණ්ඩුවට නොයෙක් සුභ සාධක සේවා පවත්වාගෙන යන්න පුළුවන් වුණා. ඒත් මේ තත්වය වෙනස් වෙන කොට රටට ඔරොත්තු දෙන විධියේ සමාජ ,ආර්ථික සහ සංස්කෘතික සංවර්ධන වැඩ පිළිවෙළක් ඇති කෙරුනේ නැහැ. ඉදිරි දැක්මක් නැතිව, ප්‍රතිපත්ති මාලාවක් හෝ සැලැස්මක් නැතිව, කෙටි කාලීනව දේශපාලන බලය අල්ලා ගැනීම සහ පවත්වා ගැනීම සඳහා අවස්ථාවාදී ලෙස කටයුතු කිරීම ප්‍රතිඵල අපට අද දකින්න තිබෙනවා. අපේ රටේ ජිවත්වන බහුතරයක් ජනතාව අත්දකිමිනුත් සිටිනවා. එහෙත් තවමත් අපි ගමන් කරමින් සිටින්නේ ඒ මාවතේම නොවෙයිද?

මෙහි ප්‍රතිඵලයක් වුණේ පසුගිය අවුරුදු හතෙන් වැඩි කාලයක්ම හදිසි නිතීය යටතේ රට පාලනය කිරීම, වැඩ කරන ජනයා වැඩ වර්ජනය කිරීම, දකුණෙත් උතුරෙත් කැරලි ගැසීම, භයෙන් සැකයෙන් සහ අස්ථිර භාවයෙන් යුතුව ජිවත් වෙන්න සිදු වීම, රටේ සිටින විවිධ ජන කොටස් වලට සමානත්වයෙන් හෝ ගරුත්වයෙන් යුතුව නොසැලකීම, අප අතර තිබෙන විවිධත්වය පිළිනොගැනීම, ජාතිය, භාෂාව සහ ආගම අනුව වෙනස්කම් කොට ජන කොටස් අතර වැට කඩුළු ගොඩ නැගීම, අපි එකිනෙකා සතුරන් වශයෙන් සලකා අපි අපිම විනාශකර ගැනීම සඳහා රටේ ස්භාවිකව සහ මානව සම්පත් යොමු කිරීම, සාමාකාමීව සාකච්ඡා මගින් අපි අතරේ තිබෙන ප්‍රශ්න විසඳා ගන්නේ නැතිව, පිට අයගේ ආධාරත් අරගෙන අපි රටේ ජිවත්වන අපේම අයට ගහලා විනාශ කරන්න කටයුතු කිරීම වැනි දේවල්. මේ නිසා තමයි හතලිස් ගණන්වල අපට වඩා අඩු දියුණුබවකින් හිටපු බොහෝ රටවල් දැන් අප පහුකර බොහෝ ඉදිරියට ගොස් තිබෙන්නේ.

ආර්ථික ප්‍රශ්න ගැන විස්තර කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. සියයට හත්තෑවක පමණ වේගයකින් රටේ ආර්ථිකය වාර්ෂිකව සංවර්ධනය වුණාට, උද්ගමනය නිසා රටේ ජන කොටස් වලට ලොකු අභියෝග වලට මුහුණ දෙන්න වෙලා තියෙනවා. මහබැංකුවේ ගණන් හිලව් දිහා ටිකක් හොඳට බැලුවොත් පේනවා ආර්ථිකයට යුද්ධයෙන් ඇතිවෙච්ච බලපෑම, ආර්ථික නිෂ්පාදක අංශ වල සැලකිය යුතු වර්ධනයක් නැති වීම සහ ඇති නැති සමාජය පරතරය වර්ධනය වෙමින් පැවතීම. දැනට පවතින ආර්ථික වර්ධනය වේගයෙන් සියයට හතරක් පමණ පදනම් වන්නේ පුද්ගලික, සෞඛ්‍ය, අධ්‍යාපන සහ මුල්‍ය සේවාවන් සහ තොග වෙළඳ පොළේ කෙරෙන කටයුතු ,දමිළ ඊළම් සංවිධානයට විරුද්ධව කරන යුද්ධය පලල්කිරීම මතයි. සියයට දෙකක් පමණ කර්මාන්ත මතත් සියයට එකක් පමණ කෘෂිකර්මය මත පදනම් වෙනවා.

ඇති නැති පරතරය මුලික වශයෙන් වැඩි වෙමින් තිබුණෙ රටේ ආණ්ඩු විසින් ගෙන ගිය ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ පුද්ගලීකරනය කිරීමේ ප්‍රතිපත්ති නිසා බවයි මගේ හැගීම. වෙළඳ ශේෂය වැඩිවෙමින් පවතිනවා. පිටරට වලින් යුදආයුද විශාල වශයෙන් මිලට ගන්නට සිදු වෙලා. ගෙවීම් තුළනය කරගන්නේ ජාත්‍යන්තර මුල්‍ය වෙළඳ පොළෙන් ණය මුදල් ගැනිමෙන්. වැඩ කරන ජන කොටස් වල ආදායම වේගයෙන් කඩා වැටෙමින් තිබෙනවා. ඔවුන්ගෙන් සහනාධාරත් ඉවත් කරමින් තිබෙන්නේ. අපේ රටේ ජනගහණය සියයට හැට අටක් කෘෂිකර්මයේ නියැලෙන්නේ. නමුත් අවශ්‍ය පහසුකම් රජයෙන් නොසැපෙයෙන නිසා වී ගොවිතැන ඇතුළු කෘෂිකාර්මික කටයුතු කඩා වැටෙමින් තිබෙනවා.

රටේ සමස්ත ණය ප්‍රමාණයත්, ඊට ගෙවන පොලී අනුපාතයත් වේගයෙන් ඉහළ නගමින් තිබෙනවා. දැනට සියයට විස්සක් ඉක්මවා යන උද්ධමනයත් සියයට විස්සක ජීවන අංකයත් නිසා රටේ මුළු මහත් ජනතාවගේ ජීවන තත්වය කඩා වැටෙමින් තිබෙනවා. මෙතෙක් කල් යුද්ධය නිමාවෙන් පසුව ආර්ථික සහන බලාපොරොත්තුවෙන් සිටි ඔවුන් දැන් දැන් තරමක අසහනයකටත්, බලාපොරොත්තු කඩවිමකටත් පත්වෙමින් සිටින බව පේනවා. සංචාරක සේවාව කඩා වැටෙනවා. රුපියල ඉතා වේගයෙන් බාල්දු වෙලා. සිංහල, දමිළ, මුස්ලිම් සාමාන්‍ය ජන කොටස් ජිවත ගැට ගහගන්නේත්, ආණ්ඩුව අයවැය පියවන්නේත් මැදපෙරදිග සහ අනෙක් රටවල් වල සේවය කරන අපේ අය විසින් බිලියන ගණනින් උපයන විදේශ විනිමය මගින්. මට පේන ආකාරයට නම් මෙයින් පිලිඹිබු වන්නේ රටේ පවතින දරිද්‍රතාවයයි.

කෙටියෙන් කිව්වොත්, මොන විදියට සංඛ්‍යාලේඛන සංගණනය කරල පෙන්නුවත්, රටක ආර්ථික දියුණුව මැනිය යුත්තේ එම දියුණුව එම රටේ සාමාන්‍ය ජනතාවගෙ ජිවිත ගොඩ නගා ගන්න කෙතරම් දුරකට ආධාර වෙලා තියෙනවා යන්න මතයි. රටේ තත්වය මෙහෙම වුණාත් මෙම ජන කොටස් තමන්ගේ ජිවිත ගැට ගහගැනීමට වැඩි පඩි හෝ වෙනත් සහන ඉල්ලුවොත්, ඔවුන් ද්‍රෝහින් හා ත්‍රස්තවාදින් හැටියට හංවඩු ගහනවා. 2002 දී ආණ්ඩුවට සටන් විරාම ගිවිසුමක් අත්සන් කරන්න සිදු වුණෝ වසර ගණනවක් තිස්සේ ගෙන ගියපු " සාමය සඳහා වු යුද්ධය " පරාජය වෙලා, ආර්ථික අර්බුදය උත්සන්න වෙලා, ආර්ථික වර්ධන වේගය ඍණ බවට පත්වෙච්ච තත්වය තුළ බව මෙහිදී මතක් කළ යුතුයි.

ඇයි අපට මෙහෙම වුණෝ? අපි මුල්තැන දිය යුතු දේවල් වලට මුල්තැන දුන්නේ නැද්ද? මේ විදියට ජන ජිවිත කඩා වැටිම අපට පමණක් ආවේණික දෙයක්ද? තවත් රටවල ජන කොටස් වලටත් මේ තත්වය පොදු දෙයක්නම්, මීට බලපාපු හේතු මොනවාද? මෙවැනි තත්වයකට සාර්ථක ලෙස මුහුණ දෙන කටයුතු කරන රටවලුත් තියෙනවාද? මීළග සටහන්වලින් අපි මේ පිළිබඳව සැකවින් සලකා බලමු.

**ලයනල් බෝපගේ**

## ජගත් ජේ එදිරිසිංහ ගේ ''ගිම්හාන සුළඟ''දොරට වඩියි




සන්නස පුවත් පතේ කොටස් වශයෙන් පළ වූ ජගත් ජේ එදිරිසිංහ ගේ ''ගිම්හාන සුළඟ'' නවකතාව දයාවංශ ජයකොඩි සමාගමේ ප්‍රකාශණයක් ලෙස මැයි 27 වන දින එම සමාගමේ මරදාන නව ප්‍රදර්ශනාගාරයේ දී දොරට වැඩියේ ය. කෞෂල්‍යා ධර්මවර්ධන නම් වන තරුණිය වඩා ගෙතුණ, සන්නසේ පුරා මාස 18 ක් පළවූ, ''ගිම්හාන සුළඟ'' බොහෝ දෙනෙකුගේ සැළකිල්ලට බඳුන් වූ නවකාතාවකි.

''ගිම්හාන සුළග''' නවකතාවේ පිටකවරය වරුණ සාවින්ද ගේ ය